චක්‍රලේඛ අංක :- 11/2007

මගේ අංකය:- බප/සසේකො/ලේ.නිර්/2007
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ - 08.
2007.06.08

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිති
සභාපතිවරුන් වෙත.

විදේශ සංචාර සඳහා සමුපකාර සේවකයින්ට නිවාඩු ලබා දීම

වසර තුනක සේවා කාලයක් සපුරා ඇති කොමිෂන් සභාව විසින් ස්ථිර පත්වීමක් කරනු ලැබ ඇති සේවකයන්ට පමණක් සේවා අවශ්‍යතාවයන්ට යටත්ව පහත දැක්වෙන කොන්දේසි යටතේ දින 30 කට නොවැඩි කාලයක් සඳහා විදේශ සංචාර හෝ අසනීපයක් වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට හෝ විදේශ නිවාඩු ලබා දිය හැකිය.

1. මෙම දින 30 ගණන් බැලීමේ දී සාමාන්‍ය සතියේ නිවාඩු දින සහ සමුපකාර සේවකයින් සඳහා අනුමත නිවාඩු දින ද ඇතුලත් විය යුතුය.

2. අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත මෙම නිවාඩුව අනුමත කල යුතුය.

3. පූර්ව වර්ෂ දෙකේ ඉතිරි අසනීප නිවාඩු වෙතොත් එකී නිවාඩු දින වැටුප් සහිත සේ සැලකිය හැකිය. ඉන් ආවරණය නොවන කාලය වැටුප් රහිත වේ.

4. මසකට වැඩි කාලයක් වෛද්‍ය හේතු මත නියමිත වෛද්‍ය සහතික ඉදිරිපත් කරමින් නිවාඩු ඉල්ලා සිටියහොත් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි වෛද්‍ය සහතිකවලින් ආවරණය වන කාලය සඳහා ඉහත සඳහන් දින 30 ඉක්මවා වැටුප් රහිත නිවාඩු අනුමත කළ හැකිය.

5. වෛද්‍ය හේතු හැර වෙනත් හේතු මත කිනම් හෝ ආකාරයකින් දින 30 කට වැඩි කාලයක් විදේශ නිවාඩු ලබා ගැනීමේ දී එසේ ලබා ගත් නිවාඩු කාලය පාරිතෝෂික ගණනය කිරීමේ දී සේවා කාලය සේ ගණන් නොගත යුතුය. (මුළු නිවාඩු කාලය සඳහාම)

6. සාධාරණ හේතුවක් නොදන්වා නියමිත දිනට සේවයට වාර්තා කිරීමට අපොහොසත් වුව හොත් සේවය හැර ගියා සේ සැලකිය යුතුය.

7. එසේ විදේශ ගත වන අවස්ථාවේ දී සේවකයා විසින් ගෙවිය යුතු ණය සහ අනෙකුත් ගෙවීම් වෙනුවෙන් වසර 5 ක සේවා කාලයක් ඇති ස්ථිර සේවකයෙකු ගෙන් ඇපයක් ලබා ගත යුතුය.

8. තමා භාරයේ ඇති බඩු බාහිරාදිය ආපසු බාර දීමේ දී තම ඇප මුදලට වඩා වැඩිපුර මුදලක භාණ්ඩ අඩුවීමක් ඇතොත් නිවාඩු අනුමත කිරීමට පෙර ඇප මුදල ඉක්මවා ඇති මුදල සමිතියට ගෙවිය යුතුය. එසේම බඩු අඩුවීම් සම්බන්ධයෙන් දැනටමත් ගෙවීමට

...........02

**නියමිත මුදලක් ඇතොත් ඒ සඳහා ද වසර 5 ක ස්ථිර සේවයක් සහිත සේවකයෙකු ඇපකරු වශයෙන් ඉදිරිපත් කල යුතුය.**

9. **මෙම නිවාඩු අනුමත කිරීමේ දී සේවා අවශ්‍යතාවයන්ට යටත්ව අනුමත කල යුතුය.**

කොමිෂන් සභාවේ අනුමැතිය පරිදිය.

කේ.කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. බස්නාහිර පළාත්, පළාත් මාර්ග හා සමුපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, පළාත් මාර්ග හා සමුපකාර අමාත්‍යංශය (බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, ගම්පහ, කළුතර)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්